# කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2015
# செயலணி அறிக்கையும் கணக்குகளும் - 2015
# Performance Report and Accounts- 2015



**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල**
**மாவட்டசெயலகம் - குருணாகல்**
**District Secretariat - Kurunegala**

# පටුන


| අංකය | පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|---|
| 1 | හැඳින්වීම | |
| 1.1 | දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ පණිවිඩය | 1 |
| 1.2 | දැක්ම | 2 |
| 1.3 | මෙහෙවර | 2 |
| 1.4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු | 2 |
| 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන් | 2 |
| 1.6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය | 3 |
| 1.7 | පාලිත ආයතන | 3 |
| 1.8 | දිස්ත්‍රික්කයේ තොරතුරු | 4 |
| 1.9 | දිස්ත්‍රික් සැලැස්ම | 5 |
| 1.10 | කාර්ය මණ්ඩල සැකැස්ම | 6 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා | 7 |
| 2.1 | ආයතන අංශය | 7 |
| 2.2 | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය | 7 |
| 2.3 | පුපුරණ ද්‍රව්‍ය අංශය | 17 |
| 2.4 | ප්‍රවෘත්ති අංශය | 17 |
| 2.5 | දිස්ත්‍රික් දිවිනැගුම අංශය | 17 |
| 2.6 | සමාජ ආරක්ෂණ අංශය | 22 |
| 2.7 | මිණුම් ඒකක ප්‍රමිති සේවා අංශය | 22 |
| 2.8 | වෘත්තීය මාර්ගෝපදේශන අංශය | 22 |
| 2.9 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | 23 |
| 2.10 | සංඛ්‍යා ලේඛණ අංශය | 23 |
| 2.11 | ජාතික පොහොර ලේකම් කාර්යාලය | 25 |
| 2.12 | රාජ්‍ය නොවන සංවිධාන අංශය | 27 |
| 2.13 | සංස්කෘතික අංශය | 27 |
| 2.14 | බෞද්ධ කටයුතු අංශය | 28 |
| 2.15 | සමාජ සේවා අංශය | 28 |
| 2.16 | ආපදා කළමණාකරන සම්බන්ධීකරණ අංශය | 29 |
| 2.17 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | 29 |
| 2.18 | පාරිභෝගික අධිකාරිය | 29 |
| 2.19 | මෝටර් රථ අංශය | 30 |
| 2.20 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය | 31 |
| 2.21 | අභ්‍යන්තර විගණන අංශය | 31 |
| 2.22 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය | 31 |
| 2.23 | ඉංජිනේරු අංශය | 32 |
| 2.24 | රැකියා සේවා මධ්‍යස්ථානය | 37 |
| 2.25 | කෘෂිකර්ම අංශය | 37 |
| 2.26 | ඵලදායිතා | 37 |
| 2.27 | ගිණුම් අංශය | 38 |
| | වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්වීම | 38 |
| | ප්‍රතිපාදන වලට එරෙහි වියදම | 38 |
| | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 27201 | 39 |
| | පොදු තැන්පත් | 40 |
| | ආදායම් ගිණුම | 40 |
| | භාණ්ඩාගාර අග්‍රිම ගිණුම | 40 |
| | රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | 41 |
| | උපලේඛණ 02 | 42 |
| | උපලේඛණ 03 | 44 |
| | වාර්ෂික විසර්ජන ගිණුමේ තොරතුරු | 46 |
| | ඩී.ජී.එස්.ඒ. 2 | 46 |
| | ඩී.ජී.එස්.ඒ. 3 | 47 |
| | ඩී.ජී.එස්.ඒ. 4 | 49 |
| | ඩී.ජී.එස්.ඒ 5 | 51 |
| | ඩී.ජී.එස්.ඒ 5 (i) | 52 |
| 2.28 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 53 |
| 3 | සමාප්තිය | 54 |

## දිසාපතිතුමාගේ පණිවුඩය.......



කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 වසර සදහා වූ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව ඉමහත් සතුටින් යුතුව ඔබ වෙත ඉදිරිපත් කරමි. ප්‍රාදේශීය කාර්යාල 30 න් සමන්විත විශාලතම පරිපාලන දිස්ත්‍රික්කය වන කුරුණෑගල දිස්ත්‍රික්කය, විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සමග අත්වැල් බැදගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්,ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් 2015 කාර්ය හා ගිණුම් වාර්තාව ලෙස ඔබ අතට පත් කරන්නට ලැබීම ඉමහත් සතුටකි.

රජය මගින් ක්‍රියාත්මක යහපාලන ක්‍රියාවලිය යථාර්තයක් බවට පත් කිරීම සදහා මහා භාණ්ඩාගාරය 2015 වසර සදහා වෙන් කර දුන් ප්‍රතිපාදන සහ අක්මුදල් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඵලදායී ලෙස යොදාගත් ආකාරය මෙයින්  පැහැදිලි වේ. මේ සදහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග අනෙකුත් සේවා සපයන ආයතනයන් සහ නිලධාරීන් ඉමහත් කැපවීමෙන් කටයුතු කල බව සිහිපත් කරමි.

ගම් නගා සිටුවීමේ වැඩ සටහන, පාසැල් මට්ටමින් වකුගඩු රෝග නිවාරණය සදහා පානීය ජල පහසුකම් ලබා දීමේ වැඩසටහන,දිවිනැගුම සංවර්ධන ආයෝජන වැඩසටහන,ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති, ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරමින් අපගේ කාර්ය මනාව ඉටු කල ආකාරය සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් පිළිබදව ද මෙහිදී සදහන් කරනු කැමැත්තෙමි.

මෙම දිස්ත්‍රික්කයේ ජනතාව තෘප්තිමත් කරමින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව, අප යන ගමන් මගට අත්වැල් වෙමින් අපට සහයෝගය දුන්,රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් අනෙකුත් සියලුම ආයතනයන්හි නිලධාරීන්ටත්,සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ටත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාගේ කාර්ය මණ්ඩලයටත් හද පිරි ස්තූතිය මෙයින් පිරිනමමි.

ගාමිණී ඉලංගරත්න
කුරුණෑගල දිසාපති / දිස්ත්‍රික් ලේකම්
ස්වදේශ කටයුතු අතිරේක ලේකම්.

## කාර්යය සාධන වාර්තාව හා ගිණුම් - 2015

භාණ්ඩාගාර ලේකම්ගේ අංක පී.එෆ්/එෆ්.එස්/03 (xiv) හා 2002 සැප්තැම්බර් මස 12 වන දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 අනුව, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා වූ කාර්යය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

**1.2** දැක්ම

පුරවැසි තෘප්තිය සඳහා වූ විශිෂ්ඨ රාජ්‍ය සේවාවක්.

**1.3** මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව සැලසුම් සහගතව සම්පත් හා ආයතන ඵලදායි ලෙස කළමණාකරනය කරමින් පුරවැසි අවශ්‍යතා තෘප්තිමත් කරන තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.

දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි, තිරසාර සංවර්ධනයක් උදෙසා, රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ මනා සැලැස්මකින් යුතුව, සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නා වූ සම්බන්ධීකරණයක් තුලින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව සාධාරණව යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙවරයි.

**1.4** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු

- රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් විවිධ අණපනත් වලින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුලින් ජනතා අභිලාෂයන් හා අපේක්ෂාවන් ඉටු කිරීම.

- දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා මානව මුල්‍ය හා භෞතික සම්පත් කාර්යක්ෂමව මෙහෙයවීම.

**1.5** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන්

- රජයේ සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කටයුතු සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

- ව්‍යවස්ථාපිත අණපනත් වලින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.

- වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල දිස්ත්‍රික් නියෝජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කිරීම.

- දිස්ත්‍රික්කය තුල නීතිය හා සාමය පවත්වාගෙන යාමටත් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ආරක්ෂක අංශය සමඟ මනා සබඳතාවයක් පවත්වා ගැනීම.

- රාජ්‍ය ආදායම ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ආදායම එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## 1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික මූල්‍ය සම්පත් ඵලදායිවත්, කාර්යක්ෂමවත් යොදා ගනිමින් අපගේ පුරවැසි ප්‍රඥප්තියට අනුකූලව එකිනෙකාගේ තත්ව පරිපාටි පිළිබඳව මනා අවබෝධයෙන් යුතුව, ක්‍රියාකාරී සහභාගිත්වයෙන් දිස්ත්‍රික්කයේ පුරවැසියන් හට තෘප්තිමත් හා විශිෂ්ටවූත් ගුණාත්මක සේවාවක් නිරන්තර වැඩිදියුනු කරමින් අඛණ්ඩව ලබාදීම අපගේ තත්ව ප්‍රතිපත්තියයි.

## 1.7 පාලිත ආයතන

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ මඟ පෙන්වීම, අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පහත සඳහන් ආයතන හා අංශ ක්‍රියාත්මක වේ.

- ආයතන අංශය
- ගිණුම් අංශය
- ඉංජිනේරු අංශය
- දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- දිවිනැගුම අංශය
- සංස්කෘතික අංශය
- බෞද්ධ කටයුතු අංශය
- සමාජ ආරක්ෂණ අංශය
- ප්‍රවෘත්ති අංශය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය
- ආපදා කළමනාකරණ අංශය
- වෘත්තීය මාර්ගෝපදේශ අංශය
- සමාජ සේවා අංශය
- මානව සම්පත් හා ඵලදායිතා ප්‍රවර්ධන අංශය
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
- සංඛ්‍යා ලේඛණ අංශය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක්
- මෝටර් රථ අංශය
- පුපුරණ ද්‍රව්‍ය අංශය
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය

## 1.8 දිස්ත්‍රික්කයේ තොරතුරු

වයඹ පලාත තුල පිහිටා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර **4812.7** කි.එනම් හෙක්ටයාර් **481270** කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **30** කි. ග්‍රාම සේවා වසම් **1610** ක් අයත් වෙයි.දිස්ත්‍රික්කයේ මුළු ගම්මාන සංඛාව **4432** ක් වන අතර ජන්ද කොට්ඨාශ **14** කි. දිස්ත්‍රික්කයේ මහ නගර සභා **01** ක් හා නගර සභා **01** ක් ඇත. ප්‍රාදේශීය සභා **19** කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප **06** කි.

සාපේක්ෂ වශයෙන් ගත් කල කුරුණෑගල දිස්ත්‍රික්කය දිස්ත්‍රික්ක **5** කින් වට වී ඇත. එනම් උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයත්, නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයත්, දකුණින් ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කත්, බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයත් වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම උතුරු ඛණ්ඩාංක **228-333** සහ නැගෙනහිර ඛණ්ඩාංක **104-178** ත් අතර වෙයි.

ඓතිහාසික පසුබිම ගැන කථා කරන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අන් දිස්ත්‍රික්ක වලට වඩා වැඩි සුවිශේෂී තාවයක් ගනී. එනම් රාජධානි හතරක් පැවති ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස අභිමානයක් කුරුණෑගලට හිමිව තිබීමයි. පඬුවස්නුවර, කුරුණෑගල, යාපහුව, දඹදෙණිය එම රාජධානින් වන අතර මෙම රාජධානි යුග වලදී කීර්තිමත් රජවරු රැසක්ම සිටි බවට සාක්ෂි ඕනෑ තරම් හමුවේ.

දිස්ත්‍රික්කයේ ජල වහනය සලකන විට එය ප්‍රධාන වශයෙන් ගංගා ද්‍රෝණි **04** ක් මගින් ආවර්ණය වී ඇත. එනම් උතුරු ප්‍රදේශයෙන් කළා ඔය දෝණියද,මධ්‍යම ප්‍රදේශයෙන් මී ඔය හා දැදුරු ඔය දෝණිද, දකුණු ප්‍රදේශයෙන් මා ඔය දෝණියද වශයෙනි. මෙම ජල වහන ද්‍රෝණි තුල රාජාංගනය, උස්ගල සියඹලන්ගමුව, හක්වටුනාඔය, කිඹුල්වානා ඔය, බතලගොඩ, මාගල්ල, පාලුකඩවල, අතරගල්ල, මැඩියාව, වෙන්නොරුව, අඹකොලවැව ඇතුළු මහා පරිමාණ හා සුළු පරිමාණ වාරිමාර්ග ක්‍රම රාශියක් ක්‍රියාත්මක වෙයි.

දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් **900 - 2200** අතර වෙයි. ඊසාන දිග මෝසම් සුළං හා නිරිත දිග මෝසම් සුළං හා සංවහන ක්‍රියාකාරිත්වය නිසා ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන අතර වැඩිම ප්‍රමාණයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සුළං ප්‍රවාහය මගිනි.

## 1.9 දිස්ත්‍රික් සැලැස්ම

# කුරුණෑගල දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ. කාර්යාලය | ග්‍රාම නිලධාරී වසම් ගණන |
|---|---|
| 1. ගිරිබාව | 35 |
| 2. ගල්ගමුව | 62 |
| 3. ඇහැටුවැව | 35 |
| 4. මහව | 68 |
| 5. අඹන්පොල | 28 |
| 6. කොටවෙහෙර | 31 |
| 7. රස්නායකපුර | 28 |
| 8. නිකවැරටිය | 42 |
| 9. පොල්පිතිගම | 82 |
| 10. ඉබ්බාගමුව | 74 |
| 11. ගනේවත්ත | 42 |
| 12. රිදීගම | 113 |
| 13. මාවතගම | 71 |
| 14. මල්ලවපිටිය | 45 |
| 15. කුරුණෑගල | 54 |
| 16. මාස්පොත | 33 |
| 17. වීරඹුගෙදර | 38 |
| 18. පොල්ගහවෙල | 84 |
| 19. අලව්ව | 66 |
| 20. නාරම්මල | 54 |
| 21. කුලියාපිටිය නැගෙනහිර | 45 |
| 22. කුලියාපිටිය බටහිර | 68 |
| 23. වාරියපොල | 56 |
| 24. පඩුවස්නුවර නැගෙනහිර | 36 |
| 25. බමුණාකොටුව | 36 |
| 26. කොබෙයිගනේ | 35 |
| 27. පඩුවස්නුවර බටහිර | 67 |
| 28. බිංගිරිය | 52 |
| 29. උඩුබද්දාව | 43 |
| 30. පන්නල | 87 |
| | 1610 |






## 1.10 කාර්ය මණ්ඩල සැකැස්ම

**කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන සටහන පහත දැක්වේ.**



2. <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා.</u>

2.1 ආයතන අංශය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ආයතන කටයුතු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30ක දිස්ත්‍රික් මට්ටමේ ආයතන කටයුතු ඉටු කිරිම ආයතන අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි. දිස්ත්‍රික්කයේ සමස්ත පරිපාලනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යවන ආයතනික පසුබිම ක්‍රියාත්මක කරනු ලබන්නේ ආයතන අංශය මගිනි.

2015 වර්ෂය ආරම්භයේ විනය ගොනු 19 ක් පැවති අතර, ඉන් ගොනු 8 ක වැඩ අවසන් කිරිමට හැකි විය.වර්ෂය තුළ ගිනි අවි අයදුම්පත් 59 ක් ලැබී තිබු අතර, ඉන් සුදුසුකම් ලද අයදුම්පත් 26ක් නිර්දේශ කර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. මෙම වර්ෂය තුළ අළුත් කළ ගිනි අවි බලපත්‍ර සංඛ්‍යාව 2073 ක් වන අතර මුරකරු අවසර පත්‍ර 119 ක් නිකුත් කිරිම සිදු විය.

2015 වර්ෂය තුළ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන අළුත් වැඩියාව සඳහා රුපියල් 1,732,888.88 ක මුදලක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන අළුත් වැඩියාව සඳහා රුපියල් 6,990,586.69 ක මුදලක් වියදම් වී ඇත.

2015 වර්ෂයේ මූලික පරිඝණක පුහුණු පාඨමාලා 03 ක්, පේරෝල් පුහුණු පාඨමාලා 02 ක් Internet -Email පුහුණු පාඨමාලා 01 ක් , Access Deta base - 03 ක් CIGAS පරිඝණක පාඨමාලා 02 ක්, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය පරිපාලනයට සම්බන්ධ නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරිම සඳහා වූ විවධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

2.2 දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය.

දිස්ත්‍රික්කය තුළ කෙරෙන ප්‍රධාන සංවර්ධන කටයුතුවල සම්බන්ධීකරණ ඒකකය දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයයි.

1. ගම් නගා සිටුවිමේ වැඩසටහන.

2015.12.31 දිනට ප්‍රගති සාරාංශය පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රා.නි. වසම් සංඛ්‍යාව | නිදහස්කල ප්‍රතිපාදනය රු. මි. | අනුමත ව්‍යාපෘති සඳහා රජයේ දායකත්වය රු.මි. | අනුමත ව්‍යාපෘති සඳහා ප්‍රජා දායකත්වය රු.මි. | අනුමත ව්‍යාපෘතිවල මුළු වටිනාකම රු.මි | සමස්ථ වියදම රු.මි. | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| ගිරිබාව | 35 | 34.650 | 35.000 | 8.750 | 43.750 | 34.562 | 29,739 |
| ගල්ගමුව | 62 | 61.380 | 62.000 | 15.500 | 77.500 | 60.474 | 65,787 |
| ඇහැටුවැව | 35 | 34.650 | 35.000 | 7.495 | 42.495 | 34.482 | 30,975 |
| මහව | 68 | | | 16.990 | 84.990 | 67.205 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 67.320 | 68.000 | | | | 32,817 |
| අඹන්පොල | 28 | 27.720 | 28.000 | 7.308 | 35.308 | 27.693 | 21,865 |
| පොල්පිතිගම | 82 | 81.180 | 82.000 | 22.198 | 104.198 | 80.241 | 56,158 |
| කොටවෙහෙර | 31 | 30.690 | 31.000 | 7.750 | 38.750 | 30.493 | 19,188 |
| රස්නායකපුර | 28 | 27.720 | 28.000 | 9.427 | 37.427 | 27.383 | 27,229 |
| නිකවැරටිය | 42 | 41.580 | 42.000 | 12.816 | 54.816 | 40.347 | 33,554 |
| කොබෙයිගනේ | 35 | 34.650 | 35.000 | 3.561 | 38.561 | 34.195 | 31,265 |
| ඉබ්බාගමුව | 74 | 73.260 | 74.000 | 4.861 | 78.861 | 72.233 | 75,238 |
| ගනේවත්ත | 42 | 41.580 | 42.000 | 2.150 | 44.150 | 41.115 | 25,387 |
| රිදීගම | 113 | 111.870 | 113.000 | 4.964 | 117.964 | 110.914 | 53,254 |
| මාවතගම | 71 | 70.290 | 71.000 | 17.750 | 88.750 | 68.318 | 39,419 |
| මල්ලවපිටිය | 45 | 44.550 | 45.000 | 2.824 | 47.824 | 44.149 | 52,256 |
| කුරුණෑගල | 54 | 53.460 | 54.000 | 2.995 | 56.995 | 51.412 | 39,874 |
| මාස්පොත | 33 | 32.670 | 33.000 | 1.339 | 34.339 | 32.201 | 29,528 |
| වීරඹුගෙදර | 38 | 33.957 | 34.300 | 1.019 | 35.319 | 33.776 | 31,754 |
| පොල්ගහවෙල | 84 | 83.160 | 84.000 | 1.930 | 85.930 | 82.948 | 75,565 |
| අලව්ව | 66 | 65.340 | 66.000 | 11.521 | 77.521 | 65.018 | 50,503 |
| නාරම්මල | 54 | 53.460 | 54.000 | 3.969 | 57.969 | 52.951 | 37,514 |
| කුලියාපිටිය නැ/ | 45 | 44.550 | 45.000 | 0.787 | 45.787 | 43.354 | 47,333 |
| කුලියාපිටිය බට/ | 68 | 67.320 | 68.000 | 4.131 | 72.131 | 65.755 | 57,174 |
| වාරියපොල | 56 | 55.440 | 56.000 | 9.303 | 65.303 | 54.997 | 41,454 |
| බමුණාකොටුව | 36 | 35.640 | 36.000 | 9.000 | 45.000 | 35.427 | 26,486 |
| පඩුවස්නුවර නැ/ | 36 | 35.640 | 36.000 | 9.000 | 45.000 | 35.050 | 25,193 |
| පඩුවස්නුවර බට/ | 67 | 66.330 | 67.000 | 16.750 | 83.750 | 66.013 | 33,658 |
| බිංගිරිය | 52 | 51.480 | 52.000 | 7.652 | 59.652 | 50.859 | 30,648 |
| උඩුබද්දාව | 43 | 42.570 | 43.000 | 1.788 | 44.788 | 41.638 | 40,424 |
| පන්නල | 87 | 86.130 | 87.000 | 22.523 | 109.523 | 85.506 | 84,797 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති (විරඹගෙදර ) | | 3.663 | 3.700 | | 3.700 | 3.637 | 2,300 |
| දි.ලේ.පරිපාලන වියදම් | - | 16.100 | - | - | - | 13.647 | |
| එකතුව | 1610 | 1,610.000 | 1,610.000 | 248.052 | 1858.052 | 1587.993 | 1,248,336 |

**එළගම්මිල්ලව පාසැල් මාර්ගයේ  පාලමක් ඉදිකිරිම.**




**හිදෝගම මහවෙල දක්වා මාර්ගය හරහා පැති බැමි සහිත පාලමක් ඉදිකිරිම.**



**නබඩෑව වැව් වානේ තැලවිල්ල ඉදිකිරිම.**





**සිරිසෙතගම විද්‍යාලයේ නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරිම.**



**පරණගම ශ්‍රී නාගාරාම දහම්පාසල් ගොඩනැඟිල්ල ඉදි කිරීම.**



**කරවුල්ල සම්බුද්ධාලෝක විහාර මාවතේ ඉතිරි කොටස තාර දැමීම.**



**අම්මනමුල්ල සර්වෝදය අසල මාර්ගය කුට්ටිගල් ඇතිරීම.**



**කට්ටම්බේරිය වැවෙහි වේල්ල ප්‍රතිසංස්කරණය කිරීම.**



**ඇතව මහ වැව වාන මතින් ගමන් කළ හැකි වන සේ මාර්ගය ( පාලමක්) ඉදිකිරීම.**



**ගල්ලෑව සමිති ශාලාව ඉදිකිරීම.**



**2. පාසැල් මට්ටමින් වකුගඩු රෝග නිවාරණය සඳහා පානීය ජල පහසුකම් ලබාදීම.**

**2015.12.31 දිනට ප්‍රගති සාරාංශය පහත දැක්වේ.**

| අනු අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | නිදහස්කල ප්‍රතිපාදන මුදල රු. | වියදම රු.මි | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ග්‍රා.නි.වස ම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| වකුගඩු රෝග නිවාරණය සදහා රු මි. 19.64 - වැය ශීර්ෂ 123-02-06-02-2105 වෙන්කල ප්‍රතිපාදන | | | | | | |
| 1 | ගිරිබාව | 3 | 893,850.00 | 893,850.00 | 1029 | 2 |
| 2 | ගල්ගමුව | 24 | 7,231,025.00 | 7,124,904.70 | 8911 | 22 |
| 3 | ඇහැටුවැව | 9 | 2,045,532.78 | 2,041,113.00 | 1657 | 8 |
| 4 | නිකවැරටිය | 12 | 3,450,474.00 | 3,450,474.00 | 2886 | 12 |
| 5 | කොබෙයිගනේ | 15 | 4,321,854.00 | 4,321,854.00 | 3957 | 15 |
| 6 | බමුණාකොටුව | 2 | 590,900.00 | 590,900.00 | 415 | 2 |
| 7 | වාරියපොල | 1 | 638,472.00 | 630,555.82 | 254 | 1 |
| 8 | මහව | | 414,302.00 | 406,097.96 | - | 9 |
| | දි.ලේ. පරිපාලන මුදල | | 37,370.78 | 37,370.78 | - | |
| | උප එකතුව | 66 | 19,623,780.56 | 19,497,120.26 | 19109 | 71 |
| වකුගඩු රෝගනිවාරණය රු මි. 98 - වැය ශීර්ෂ 123-02-06-4-2502 වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණය | | | | | | |
| 9 | කොටවෙහෙර | 14 | 3,416,230.00 | 3,248,586.00 | 2662 | 14 |
| 10 | රස්නායකපුර | 13 | 3,075,780.00 | 2,927,539.27 | 2450 | 12 |
| 11 | වාරියපොල | 7 | 2,197,800.00 | 2,197,800.00 | 2884 | 8 |
| 12 | පොල්පිතිගම | 21 | 6,729,782.00 | 6,729,782.00 | 5785 | 21 |
| 13 | මහව | 9 | 2,307,300.00 | 2,307,300.00 | 2233 | 9 |
| 14 | අඹන්පොල | 9 | 2,381,520.00 | 2,381,520.00 | 1543 | 9 |
| | දි.ලේ. පරිපාලන මුදල | | 25,812.00 | 25,812.00 | - | |
| | උප එකතුව | 73 | 20,134,224.00 | 19,818,339.27 | 17557 | 73 |
| 14 | මුළු එකතුව | 139 | 39,758,004.56 | 39,315,459.53 | 36666 | 144 |

**3. දිවිනැගුම සංවර්ධන ආයෝජන වැඩසටහන.**

**2015.12.31 දිනට ප්‍රගති සාරාංශය පහත දැක්වේ.**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | නිදහස් කල මුළු ප්‍රතිපාදන මුදල (රු.මි.) | 2015.12.31 දිනට වියදම රු.මි. | වැඩ අවස න් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | ගිරිබාව | 3 | 2.12857500 | 2.12857500 | 3 | 900 |
| 2 | ඇහැටුවැව | 1 | 1.21940941 | 1.21940941 | 1 | 216 |
| 3 | මහව | 9 | 2.30730000 | 2.30730000 | 9 | 2233 |
| 4 | අඹන්පොල | 9 | 2.38152000 | 2.38152000 | 9 | 1543 |
| 5 | පොල්පිතිගම | 22 | 7.52794770 | 7.50630102 | 22 | 5839 |
| 6 | කොටවෙහෙර | 14 | 3.41623000 | 3.24858600 | 14 | 2662 |
| 7 | රස්නායකපුර | 13 | 3.07578000 | 2.92753927 | 13 | 2450 |
| 8 | රිදීගම | 3 | 3.03000000 | 2.94745548 | 3 | 315 |
| 9 | මාවතගම | 3 | 3.03000000 | 2.74023922 | 3 | 675 |
| 10 | මල්ලවපිටිය | 3 | 3.03000000 | 2.59500775 | 3 | 220 |
| 11 | කුරුණෑගල | 2 | 3.03000000 | 2.34760859 | 1 | 105 |
| 12 | මාස්පොත | 5 | 3.07040000 | 3.06449783 | 5 | 4100 |
| 13 | වීරඹුගෙදර | 3 | 3.03000000 | 2.98105486 | 3 | 533 |
| 14 | පොල්ගහවෙල | 2 | 3.03000000 | 2.96656210 | 2 | 3400 |
| 15 | අලව්ව | 2 | 3.03000000 | 3.02993465 | 2 | 1700 |
| 16 | නාරම්මල | 3 | 3.03000000 | 3.02422789 | 3 | 2800 |
| 17 | කුලියාපිටිය නැගෙනහිර | 4 | 4.54500000 | 4.38252423 | 4 | 1013 |
| 18 | කුලියාපිටිය බටහිර | 4 | 4.54500000 | 4.46777397 | 4 | 7034 |
| 19 | වාරියපොල | 7 | 2.19780000 | 2.19780000 | 7 | 2884 |
| 20 | බමුණාකොටුව | 3 | 2.42400000 | 2.42297308 | 3 | 1650 |
| 21 | පඩුවස්නුවර බටහිර | 1 | 1.71700000 | 1.67751000 | 1 | 345 |
| 22 | උඩුබද්දාව | 3 | 3.03000000 | 2.99771189 | 3 | 1220 |
| 23 | පන්නල | 3 | 3.03000000 | 3.02725030 | 3 | 1145 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 5 | 17.70000000 | 12.60407943 | 2 | 23250 |
| 25 | දි.ලේ පරිපාලන වියදම් | | 0.51130585 | 0.15825471 | - | - |
| | ඉතිරි ප්‍රතිපාදන | | 0.19300000 | | | |
| මුළු එකතුව | | 127 | 89.26026796 | 81.35169668 | 123 | 68232 |

**4. ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරිම.**

2015.12.31 දිනට ප්‍රගති සාරාංශය පහත දැක්වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ව්‍යාපෘති ගණන | ලබාදුන් ප්‍රතිපාදනය (ප්‍රා.ලේ.1% ප.වි.සමඟ) රු.ශත | වැඩ අවසන් | 2015.12.31 දිනට වියදම (1% ප.වි.සමඟ) රු.ශත | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | අලව්ව | 4 | 3,648,439.74 | 4 | 3,487,389.97 | 1600 |
| 2 | ඉබ්බාගමුව | 1 | 1,940,568.15 | 1 | 1,885,410.57 | 988 |
| 3 | උඩුබද්දාව | 5 | 9,057,672.36 | 5 | 8,452,172.19 | 2944 |
| 4 | ගනේවත්ත | 2 | 1,967,716.29 | 2 | 1,826,654.99 | 600 |
| 5 | පඩුවස්නුවර නැගෙනහිර | 1 | 1,485,294.12 | 1 | 1,485,293.24 | 350 |
| 6 | පන්නල | 2 | 2,561,897.07 | 2 | 2,550,756.65 | 7500 |
| 7 | බිංගිරිය | 20 | 19,578,655.97 | 20 | 18,388,606.44 | 4940 |
| 8 | මාවතගම | 1 | 418,914.34 | 1 | 410,536.07 | 3000 |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම 1% | | 402,565.90 | | - | |
| | මුළු එකතුව | 36 | 41,061,723.94 | 36 | 38,486,820.12 | 21922 |

5. ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩ සටහන.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සායන මධ්‍යස්ථානයේ නම සහ වැඩ විෂය | ලබාදුන් ප්‍රතිපාදනය ප්‍රා.ලේ.ප.වි1 % සමඟ (රු.ශත) | වියදම (රු) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|
| 1 | මහව | අටවරල සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 35,322.00 | 35,322.00 | 350 |
| 2 | පන්නල | 1. සඳලංකාව සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 50 |
| | | 2. මැද්දේපොල සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 50 |
| | | 3. මාහොලව සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 80 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 4.තෙළඹුගම්මන සායන මධ්‍යස්ථානයට විදුලි සම්බන්ධතාවය ලබාගැනිම සඳහා | 21,200.00 | 21,200.00 | 50 |
| | | 5.ඇලබඩගම සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,000.00 | 20,000.00 | 200 |
| 3 | ඉබ්බාගමුව | 1.දේවගිරිය සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 600 |
| | | 2.කිරිබමුණ නව සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,000.00 | 20,000.00 | 600 |
| 4 | ගල්ගමුව | 1.බුල්නෑව සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 350 |
| | | 2.පාලුකඩවල සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,000.00 | 20,000.00 | 350 |
| 5 | මාවතගම | 1.උදානගම සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 1500 |
| | | 2.පිලැස්ස සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 1500 |
| 6 | වාරියපොල | කොනොත්ත සායන මධ්‍යස්ථානය සඳහා ජල පහසුකම් ලබාදිම | 71,834.00 | 71,834.00 | 2000 |
| 7 | කොබෙයිගනේ | සියඹලාගස්පිටිය සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 550 |
| 8 | උඩුබද්දාව | දිවුරුම්පොල සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය සඳහා වැසිකිළි පද්ධතියක් ඉදි කිරිම | 401,759.87 | 352,325.78 | 500 |
| 9 | රිදීගම | 1.එගොඩමුල්ල සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 700 |
| | | 2.මිරිස්සල මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබා ගැනීම | 20,000.00 | 20,000.00 | 300 |
| | | 3.කිතුල්ගොල්ල මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,000.00 | 20,000.00 | 288 |
| | | 4.බුළුවල මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනිම | 20,000.00 | 20,000.00 | 750 |
| | | 5.දෙල්විට මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනිම | 20,000.00 | 20,000.00 | 800 |
| 10 | නිකවැරටිය | 1.දනිකිතව මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,000.00 | 20,000.00 | 390 |
| | | 2.දනිකිතව මාතෘ සායන මධ්‍යස්ථානය සඳහා ජල සම්බන්ධතාවය ලබාදිම සඳහා | 20,979.00 | 20,979.00 | 390 |
| 11 | බමුණාකොටුව | ගන්තිරියාව සායන මධ්‍යස්ථානය වයරින්කර විදුලි සම්බන්ධතාවය ලබා ගැනිම සහ ජල සම්බන්ධතාවය ලබාදිම සඳහා | 88,844.65 | 85,309.65 | 425 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම 1% | | 4,857.47 | - | |
| | | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | මුළු එකතුව | **984,796.99** | **926,970.43** | **12773** |

**2.3** පුපුරණ ද්‍රව්‍ය අංශය.

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පත්කරනු ලැබූ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ දිස්තික්කය තුල ව්‍යාපාරික/ව්‍යාපාරික නොවන කළු ගල් කැඩීම සඳහා බලපත්‍ර ලබාදීම, රතිඤ්ඤා විකිණීමට/සෑදීමට බලපත්‍ර නිකුත් කිරීම, ගිණි අවි සඳහා පතොරම් නිකුත් කිරීම, කෘෂිකාර්මික/ආත්මාරක්ෂක ගිණි අවි සඳහා පතරොම් නිකුත් කිරීම, වෙඩි බෙහෙත් ගබඩා/වෙළඳ නියෝජිත අධීක්ෂණයයි. **2015** වර්ෂයේදී අවසර පත්‍ර **585** ක්ද, පුපුරණ ද්‍රව්‍ය ආනයන බලපත් **02** ක්ද ,රතිඤ්ඤා සඳහා බලපත්‍ර **70** ක්ද නිකුත් කරන ලදි. පතොරම් ලබා ගැනීම සඳහා නිකුත්කල ලිපි සංඛ්‍යාව **1486** කි.

**2.4** ප්‍රවෘත්ති අංශය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ ප්‍රධාන අරමුණ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමයි. ඒ වෙනුවෙන් **2015** වර්ෂය තුළ පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කර ඇත.

- දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අදාල ප්‍රවෘත්ති නිවේදන **48** සහ ඡායාරූප ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට හා ජනමාධ්‍යයන්ට නිකුත් කිරීම.

- දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අදාල කටයුතු සඳහා මාධ්‍ය සම්බන්ධිකරණ කටයුතු **21** ක් සිදු කිරීම.

- කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික සංඛ්‍යා දත්ත එකතුවක් සකස් කිරීම .

- කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාල විශේෂ ප්‍රවෘත්ති වාර්තා **379** ක් දිස්ත්‍රික් ලේකම්වරයාගේ අවධානයට ඉදිරිපත් කිරීම හා අවශ්‍ය වාර්තා අදාල ස්ථාන වෙත යොමු කිරීම.

**2.5** දිස්ත්‍රික් දිවිනැගුම අංශය.

සමාජ සවිබලගැන්වීමේ සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය හා දිවිනැගුම දෙපර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වැඩසටහන් වල දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධිකරණය, මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

මෙම කාර්යයන් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට අමතරව සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලද වෙනම අංශයන් ස්ථාපිත කර ඇති අතර කලාප මට්ටමින් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් **120** ද දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති **30** ක්ද පිහිටුවා ඇත.

**2015 වර්ෂයේ ක්‍රියාත්මක කල ප්‍රධාන වැඩ සටහන්.**

**1.** සමෘද්ධි සුභසාධන වැඩ සටහන.

අඩු ආදායම් ලාභී පවුල් වල දුගී බව අවම කිරීම අරමුණුකර **2015** වර්ෂය තුල දිවිනැගුම දෙපර්තමේන්තුව යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පහත සදහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

I. සමෘද්ධි සහනාධාර වැඩ සටහන
II. පෝෂණ වැඩසටහන
III. සමාජ ආරක්ෂණ වැඩ සටහන
IV. නිවාස ලොතරැයි වැඩසටහන
V. සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන

I. සමෘද්ධි සහනාධාර වැඩ සටහන.

අඩු ආදායම්ලාභි පවුල් සඳහා අවම යැපුම් මට්ටමක් හෝ පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මෙය ක්‍රියාත්මකයි .2015 වර්ෂයේදී සහනාධාරලාභින් 145248 සඳහා සහනාධාර නිකුත් කරන ලදී ඒ සඳහා රු.මි.3,614.97 පමණ වැය කරන ලදී.

II. පෝෂණ වැඩසටහන. (ගැබිණි හා කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් නිකුත් කිරීමේ වැඩ සටහන )

අඩු ආදායම්ලාභි ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්වය වර්ධනය කිරීම සඳහා මහින්ද චින්තන වැඩ සටහන යටතේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපර්තමේනතුව මගින් මෙම වැඩ සටහන 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරිනි.
රු.500 ක් වටිනාකමින් යුක්ත මෙම පෝෂණ පත්‍රිකාව මාස 20 ක් වලංගු වන මුද්දර 20 කි ඉන් මුද්දර 8 ක් පූර්ව මාතෘ අවධිය සඳහා ද ඉතිරි මුද්දර 12 කිරිදෙන මව සඳහා ද වෙන්කර ඇත මෙහිදි දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභී මව්වරුන් 4056 සඳහා රු .මි 6.02 ක මුදලක් වැයකර ඇත.

III. සමාජ ආරක්ෂණ වැඩ සටහන.

දිවිනැගුම සංවර්ධන දෙපර්තමෙන්තුව මගින් සමෘද්ධි ප්‍රතිලාභින්ගේ සහන සඳහා ඔවුන්ගේ යැපෙන්නන්ගේ විවිධ ආපදා අවස්ථාවලදී මූල්‍යමය සහනයක් ලබා දීමේ පරමාර්ථය ඇතිව සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවා අත. සෑම සමෘද්ධි ප්‍රතිලාභියකුගෙන්ම මසකට රු 45 /= බැගින් සමාජ ආරක්ෂණ අරමුදලට බැර කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා කටයුතු කරනු ලබයි.

දරු උපතක් සඳහා රු.5,000/= මරණයක් සඳහා රු.10,000 /=ක්ද රෝහල් ගත වීමක් සඳහා දිනකට රු.200/= ක් ද බැගින් දින 30 ක උපරිමයකට යටත්ව, විවාහයක් සඳහා රු 5,000 ක් ද මෙම අරමුදල මගින් ලබා දෙනු ලැබේ.මේ අනුව 2015 වර්ෂය සඳහා ඉහත ගෙවීම් කටයුතු වෙනුවෙන් දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් රු.මි 61.71 ක මුදලක් ලබා දෙන ලදී.ඒ පහත අන්දමට වේ.

උපත් 813 ක්සඳහා .රු.මි.4.065 ක මුදලක්ද
විවාහ සඳහා2362 ක්සඳහා රු.මි.11.81ක මුදලක්ද
රොහල්ගත වීම් 3080 ක්සඳහා රු.මි.8.96 ක මුදලක්ද
මරණ සඳහා2589 ක්සඳහා රු.25.69 ක මුදලක්

IV. සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන.

අ.පො.ස.සා.පෙ ඉහළින් සමත් දිළිදු පවුල් වල දරුවන් 700 ක් සඳහා මාස 24ක් සඳහා රු.මි.55.911 ක් මේ සඳහා වැයකර ඇත.

V. නිවාස ලොතරැයි වැඩසටහන.

සමෘද්ධි සහනාධාර මුදලින් අයකරගන්නා රු.15 මුදල යොදාගනිමින් කරනු ලබන දිනුම් ඇදිමෙන් තෝරා ගන්නා ජයග්‍රහයකයින් සඳහා රු 150,000 බැගින් නිවාස සාදා ගැනිමට ප්‍රධානය කරනු ලබයි. 2015 වසරේදී ප්‍රතිලාභීන් 226 ක් සඳහා රු.මි.33.9 ක් ලබා දි ඇත.

2. I. සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන.

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව සෑම ගෘහ ඒකකයක්ම සොඳුරු නිවහනක් බවට පත් කිරීමේ අරමුණින් ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන හා දැනට කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර ඇති ව්‍යවසායකයින් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදාගනිමින් ක්‍රියාත්මක කෙරේ.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | රජයේ දායකත්වය (රු.මි) |
|---|---|---|
| 1. කෘෂි | 2080 | 27.56 |
| 2. සත්වපාලන | 528 | 12.85 |
| 3. කර්මාන්ත | 3295 | 85.24 |
| 4. අලෙවි | 726 | 20.34 |
| 5. ධීවර | 4 | 0.16 |
| 6. වෘත්තිය පුහුණු | 7 | 0.18 |
| එකතුව | 6640 | 147.157 |

පරිපාලන වියදම් සමග වියදම රු.මි.147.157 කි.

II. සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන-චක්‍රීය අරමුදල

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව සෑම ගෘහ ඒකකයක්ම සොඳුරු නිවහනක් බවට පත් කිරීමේ අරමුණින් ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන හා දැනට කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර ඇති ව්‍යවසායකයින් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීම සඳහා ප්‍රජා මූල බැංකු සංගම් හරහා මෙය ක්‍රියාත්මක නෙරේ. 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති විස්තර පහත දැක්වේ.2015.12.31 දිනට චක්‍රීය අරදමුදලේ ශේෂය රු.මි. 359.9 කි .තවදුරටත් ණය ලබා දිය හැකි මුදල රු.මි. 166.2 කි.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | රජයේ දායකත්වය (රු.මි) |
|---|---|---|
| 1. කෘෂි | 470 | 20.21 |
| 2. සත්වපාලන | 342 | 16.852 |
| 3. කර්මාන්ත | 1061 | 46.62 |
| 4. අලෙවි | 610 | 27.63 |
| 5. ධීවර | 5 | 0.24 |
| එකතුව | 2488 | 1.556 |

ඉහත ජීවනෝපාය ව්‍යාපෘති වඩාත් සාර්ථක කර ගැනීම වෙනුවෙන් අදාල ප්‍රතිලාභින්ට තාක්ෂණ පුහුණුව ලබා දී ඇති අතර අවශ්‍ය උපකරණ කට්ටලද බෙදා දෙන ලදී.

මෙම පවුල් වල ආදායම් තත්වය පහත වැටීම වලකා ලීම සඳහා පසු විපරම් වැඩ පිළිවෙලක්ද දැනටමත් ක්‍රියාත්මක කර ඇත.මේ සඳහා දිවිනැගුම සංවර්ධන නිලධාරින් දිවිනැගුම කළමණාකරුවන් හා ප්‍රජා නායකයින් ගේ සේවය ලබාගෙන ඇත.මේ අනුව සහනාධාර මානසිකත්වයෙන් ප්‍රතිලාභි පවුල් මුදවා ගෙන ඔවුන් නිෂ්පාදන කාර්යය වෙත යොමු ගත කිරීමේ ඉහත වැඩ සටහන සාර්ථක වූ බව පෙනේ. මීට අමතරව දිස්ත්‍රික් කර්යාලයේ නිලධාරීන් මගින්ද අහඹු ලෙස ප්‍රගතිය විමසා බැලීමට වැඩ පිළිවෙලක් ද යොදා ඇත.

දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහනය යටතේ අලෙවි සංවර්ධන වැඩසටහන
ජීවනෝපාය ව්‍යාපෘතිලාභීන්ගේ ව්‍යවසායකත්ව ගුණාංග ඉහළ නැංවීමේ හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙනදපොළ අවස්ථා උදාකිරිම මෙහි අරමුණයි.

| ව්‍යාපෘතිය | සංඛ්‍යාව | රජයේ දායකත්වය (රු.මි) |
|---|---|---|
| ජංගම රථ හා කුටි | 64 | 1.258 |
| පුහුණු වැඩසටන් | 30 | 0.43 |
| වෙලඳ ප්‍රදර්ශණ | 31 | 1.6 |

**4.** සමාජ සංවර්ධන වැඩ සටහන.

දිවිනැගුම දෙපාර්තමේන්තුව මෙහෙය වීම මත මෙම වැඩ සටහන ක්‍රියාත්මක කෙරින.ආර්ථික සංවර්ධනයට සමගාමීව ආධ්‍යාත්මික සංවර්ධනයද සමාජ කණ්ඩායම් තුල වර්ධනය කිරීම මගින් යහපත් සමාජ පරිසරයක් නිරිමාණය කිරීම මෙහි මුලික අරමුණ වේ.

**I.** මතට තිත වැඩ සටහන.

සමාජ සංවර්ධන වැඩ සටහන ආරම්භයේ සිටම මත් නිවාරන කාර්යය සඳහා මූලික අවධානයක් යොමු වී තිබුණි. මත් නිවාරණ වැඩ සටහන මතට තිත නමින් ජාතික වැඩ සටහනක් බවට සෑම රාජ්‍ය ආයතනයක් මගින්ම විශේෂ අවධානය යොමුකර මින් කටයුතු කිරීම දක්නට ලැබින.සමාජ සංවර්ධන අංශය යටතේ මෙම වැඩ සටහන සඳහා විශේෂ අවධානය යොමුකර ඇත. මැයි **31** යෙදුන ජාත්‍යන්තර මත් නිවාරණ දිනය පදනම් කරගෙන දැනුවත් කිරීම්, විරෝධතා පා ගමන් ,වීදි නාට්‍ය පවත්වා මත් භාවිතයෙහි ආදීනව ප්‍රජාව වෙත පෙන්වා දීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරන ලදී.

ජාත්‍යන්තර දුම්වැටි විරෝධි කොඩි දිනය පදනම් කරගෙන දිවිනැගුම දෙපර්තමේන්තුව මගින් දිවයින පුරා වැඩසටහන් සතියක් පුරා ක්‍රියාත්මක කල අතර මුළු දිවයිනෙන්ම සිව්වන ස්ථානයට වැඩිම මුදල් එකතු කල අතර දිස්ත්‍රික්කය තුල එකතු කරන ලද මුළු මුදල රු. මිලි **16.64** කි. මෙම අරමුදල් විවිධ සමාජ සංවර්ධන කාර්යයන් සඳහා යෙදවේ.

**II.** දිරිය පියස නිවාස වැඩසටහන.

හිසට සෙවණක් නොමැතිව අන්ත අසරණව ජීවත්වන පවුල් සඳහා හිතට නිවනක් ලබාදීමේ අරමුණ ඇතිව දිරිය පියස නිවාස වැඩ සටහන ක්‍රියාත්මක කරන අතර මේ සඳහා සුදුසු කම් ලෙස නිවසක් නොමති,වැන්දඹු අසරණ කාන්තාවන් ,ගැහුණු දරුවන් වැඩි අනාරක්ෂිතව දිවි ගෙවන පවුල් ,ආබාධිත පවුල් තොරාගෙන ඇත.බොහෝ නිවාස කටුමැටියෙන් යුක්ත,ඉටිරෙදි හෝ තහඩුවලින් ආවරණය කරගෙන වහලයටද පොල් අතු,ඉලුක් මානා වැනි වෙනත් දෑ උපයෝගි කරගෙන හුදකලා අසරණ ජීවිතයක් ගෙවන පවුල් සඳහා ස්ථිර නිවසක හිමිකම ලබාදිම සඳහා මේ වසරේ එක් නිවසක් ඉදිකිරිමට රු.**75,000.00** බැගින් මුදල් ආධාර ලබාදිමට කටයුතු කර ඇත.

මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් **219** ක් සඳහා රු.මි.**16.425** ක් වැයකර ඇත.

**III.** සතුටු පවුල් වැඩසටහන

පවුලේ සාමාජිකයින් තුල එකිනෙකා කෙරෙහි ආදරය කරුණාව හා එකිනෙකාට ගෞරවය දක්වන පවුලක් බවට පමුණුවාලීම. මේ යටතේ පවුල් **230** ක් තෝරාගෙන ඇත.

**IV.** ආදර්ශ ගම්මාන වැඩසටහන

තෝරාගත් ගම්මානයත් සමෘද්ධිමත් ගම්මානයක් බවට පත්කිරිමයි. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් දිස්ත්‍රික්කය සඳහා ආදර්ශ ගම්මාන **30** ක් තෝරාගෙන ඇත.ජාතික වැඩ සටහන යටතේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාරලන්ද ගම්මානය සංවර්ධනය කිරිමට පියවර ගෙන ඇත.

**5.** දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් වැඩ සටහන.

මෙම වැඩ සටහන තුල ඉතිරි කිරිමේ ප්‍රධාන සාධකය වු යේ ප්‍රජා මූල බැංකු සංගම් වැඩ සටහනයි.මෙම දිස්ත්‍රික්කයේ යේ ප්‍රජා මූල බැංකු **120** ක් පවතින අතර දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති **30** ක් ක්‍රියාත්මක වේ.**2015** වර්ෂය සඳහා මුළු ඉතිරි කිරීම්.රු.මිලි **1637.37**වේ.

බැංකු සංගම් තුලින් ප්‍රතිලාභින් ගේ මෙන්ම අඩු ආදායම්ලාභින්ගේ ආදායම් තත්වය වර්ධනය කිරීම සඳහා අඩු පොලි පදනම මත ණය ලබා දීම සිදුකෙරින. මෙලෙස **2015** වර්ෂය තුල ලබා දෙන ලද ණය

121097 කි. ලබා දෙන ලද ණය මුදල රු .මිලි 4975.13 ලබා දී ඇත.2015 වර්ෂය අවසන් වන විට මුළු පිටහිටි ණය සංඛ්‍යාව 146654 කි.පිටහිටි ණය මුදල රු.මි.4456.60 කි.

6. ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම.

ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීමේ අරමුනින් නිළධාරින් 981 ක් පුහුණු කළ අතර වියදම රු.672,640 කි.

7. ප්‍රගති පාලනය.

දිවිනැගුම දෙපර්තමේන්තුවට අදාලව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සියළුම වැඩ සටහන් ක්‍රියාත්මකව ඇති ආකාරය විමසා බැලීම ඉලක්ක වලට අනුව ලබා ගත් ප්‍රතිඵලයන් සසදා බැලීම මේ යටතේ සිදුකෙරේ.මෙහිදි අදාල ඉලක්ක වලට අනුව ලබා ගත් ප්‍රතිඵලයන් සංඛ්‍යාත්මකව ,ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව හා කාල පරාසයන්ට අනුව ඇගයීමක් කරනු ඇත.

ඉහත කරුණු වලට අදාලව මාසිකව,ත්‍රෛයිමාසිකව ,අර්ධ වාර්ෂිකව ,වාර්ෂිකව ඇගයීමක් එක් එක් විෂයන්ට අදාලව වෙන් වෙන්ව ඇගයීමක් කර ඇත.

8. ගිණුම් හා වැටුප්.

දිවිනැගුම දෙපර්තමේන්තුව යටතේ දිස්ත්‍රික්කයට අනුයුක්තව සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ වැටුප් හා ආයතන කටයුතු ඉටු කරනු ලබන්නේ මෙම කාර්යාලය මගිනි.
මෙම දිස්ත්‍රික්කය තුල දිවිනැගුම දෙපර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන අක්මුදල් මෙම දිස්ත්‍රික්කයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර බෙදාදීම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ කටයුතු සඳහා යොදා ගැනිමත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අවශ්‍ය ස්ථාවර භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ මිලදි ගැනීමත් ගිණුම් අංශයෙන් සිදු කෙරේ.ගිණුම් කටයුතු සම්බන්ධව මාසික වාර්තා ප්‍රගති පාලන කටයුතු කිරීම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මෙහෙය වීම මෙම අංශයෙන් සිදුකෙරේ.2015 වර්ෂය සඳහා ගිණුම් සාරාංශය පහත පරිදීවේ.
2015 වර්ෂය තුලදී දිවිනැගුම දෙපර්තමේන්තුව ලද හා මෙම දිස්ත්‍රික්කය තුල බෙදා හරින ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි 2709.78ක් වන අතර මුළු අක්මුදල් ප්‍රමාණය රු.මිලි.2668.05 කි.2015 තුල දී මෙම දිස්ත්‍රික්ක යේ මුළු වියදම රු.මිලි 2651.33කි.

9. දිස්ත්‍රික් විගණන කටයුතු.

අභ්‍යන්තර විගණන නිලධාරින් 07 සමන්විත අතර විගණන කළමණාකරුවන් සංඛ්‍යාව 7 කි ඔවුන්ගේ රාජකාරි කටයුතු වන්නේ.
දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම්, දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති, මූලස්ථාන කාර්යාල, දිස්ත්‍රික් දිවිනැගුම අංශ විධිමත් ලෙස විගණනය කර වාර්තා ප්‍රධාන කාර්යාලයට ලබා දීම හා ලැබෙන පැමිණිලි පරික්ෂා කිරීමයි ඒ අනුව 2015 වර්ෂයේ දී.

වාර්ෂික ගිණුම් පරික්ෂාව - ප්‍රා.ලේ.කාර්යාල 30 ක
සෝදිසි විගණන වාර්තා - සමෘද්ධි බැංකු 120 ක
සෝදිසි විගණන වාර්තා - මහ සංගම් 30 ක
ප්‍රධාන කාර්යාලයෙන් ලද පැමිණිලි 04 ක් පරික්ෂා කිරීම හා වාර්තා ලබා දීම.
දිස්ත්‍රික් කාර්යාලට ලද පැමිණිලි 06 ක් පරික්ෂා කර වාර්තා ලබා දීම.

10. නිළධාරි පුහුණු.

ආයතන හා විනය පිළිබදව නිළධාරින් 414 ක් ද ගිණුම් කටයුතු පිලිබදව නිලධාරින් 87ක්ද පුහුණු කරන ලදී.වැය කළ මුදල රු.151,429 කි.

2.6 සමාජ ආරක්ෂණ අංශය.

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ස්වයං රැකියා හා අවිධිමත් අංශයේ රැකියාලාභීන් සඳහාත්, විවිධ ක්ෂේත්‍රයන් වල නියැළි වෘත්තිකයින් සඳහාත් ක්‍රියාත්මක කරනු ලබන දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම් කුමාගේ අධීක්ෂණය හා ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ මැදිහත් වීම යටතේ ග්‍රාම නිලධාරීන් හරහා සාමාජිකයින් බඳවාගනු ලබන්නකි.

**2015** වර්ෂයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් දායකයින් සඳහා **6040** ක ප්‍රමාණයක් බඳවාගෙන ඇති අතර, වාරික මුදල් වශයෙන් රු. **135,978,053.10** මුදලක් පහත සඳහන් පරිදි එක්රැස් කර ඇත.

| | | |
|---|---|---|
| නව බඳවාගැනීම් මගින් - | රු. | **2,102,012.00** |
| තැපැල් කාර්යාල මගින් - | රු. | **126,815,766.10** |
| දිස්ත්‍රික් කාර්යාල මගින් - | රු. | **1,284,317.00** |
| ප්‍රා.ලේ.කාර්යාල මගින් - | රු. | **4,585,594.00** |
| බැංකු මගින් - | රු. | **1,190,364.00** |

**2015** වර්ෂයේ දී විශ්‍රාම වැටුප්ලාභීන් **462** ක් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කර ඇත.
ඒ සඳහා රු. **14,059,422.22** ක මුදලක් ගෙවා ඇත.

## 2.7 මිණුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය.

මහජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි පරීක්ෂා කර මිණුම් උපකරණ වල නිවැරදිතාව තහවුරු කිරීම තුලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම දිස්ත්‍රික් ලේකම්ට පැවරුණ තවත් වගකීමකි.

මෙම අංශයේ **2015** වසරේ කාර්යය සාධනය පහත පරිදි සාරාංශ කල හැකිවේ.

- මුද්‍රා තැබීමෙන් ලද ආදයම :- රු.**13,818,029**
- මුද්‍රා තබන ලද ඒකක සංඛ්‍යාව :- **73,326**
- වෙළඳුන් සංඛ්‍යාව :- **19,242**
- සාර්ථක වැටලීම් සංඛ්‍යාව :- **130**
- තැත් කල වැටලීම් සංඛ්‍යාව :- **122**
- අයකර ඇති දඩ මුදල් :- රු.**168,500**
- දැනුවත් කරන ලද වෙළඳුන් සංඛ්‍යාව :- **2125**

## 2.8 වෘත්තීය මාර්ගෝපදේශ අංශය.

පුද්ගලයෙකුගේ දක්ෂතාවය, කුසලතාවය හා හැකියාවට ගැලපෙන වෘත්තීය කෙෂ්ත්‍රයට යාමට අවශ්‍ය මඟ පෙන්වීමත්, එම ක්ෂේත්‍රයේ දියුණුව ලබා ගැනීමට මඟ පෙන්වීමත් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල වෘත්තීය මාර්ගෝපදේශ අංශයක් ස්ථාපිත කර ඇත.

මෙම අංශය මගින් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම, "අපොසින් පසු" සිසුන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන,රැකියා සමාජ වැඩසටහන,ගුරුවරුන් සඳහා වෘත්තීය

මාර්ගෝපදේශ වැඩසටහන,රැකියා පොළ වැඩසටහන,පුද්ගලික අංශයේ සඳහා වූ රැකියා 100 වැඩසටහන,වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන,ස්වයං රැකියා පොළඹවීමේ වැඩසටහන,ව්‍යවසායකත්ව සංවර්ධන තෙදින පුහුණු වැඩසටහන,ඔබ අසිරිමත් බාහිර උපාධිධාරී වැඩසටහන,ඔබ අසිරිමත් අභ්‍යන්තර උපාධිධාරී වැඩසටහන,අවදානමට ලක් වූවන් සඳහා වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන,අවදානමට ලක් වූවන් සඳහා වූ තාක්ෂණික පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන් 2015 වර්ෂය තුල පවත්වා ඇත.

## 2.9 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අංශයකි. මෙම අංශය විසින් රැකියා විරහිත පුද්ගලයින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම, පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සංවර්ධනය කිරීම හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම පිණිස විවිධ ව්‍යාපාර කළමනාකරණ හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙයට අමතරව ව්‍යවසායකයන් නගා සිටුවීම පිණිස මූල්‍ය, අලෙවි, තාක්ෂණික, පහසුකම් සැපයීම පිණිස විවිධ ආයතනික සම්බන්ධීකරණ කටයුතු ද කරනු ලැබේ.

## 2.10 සංඛ්‍යාලේඛණ අංශය.

කුරුණෑගල දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන අංශය දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛනඥවරයකුගෙන් ද, මූලස්ථාන සංඛ්‍යා ලේඛන නිලධාරීන් දෙදෙනකුගෙන් ද, මූලස්ථාන සංඛ්‍යා ලේඛන සහකාරවරු දෙදෙනකුගෙන් ද, කළමනාකරණ සහකාරවරු දෙදෙනකුගෙන් ද, දත්ත සටහන් ක්‍රියාකරු/ කේත ලිපිකරු තුන් දෙනකුගෙන් ද, සහකාර දත්ත පාලකවරයකුගෙන් ද, සංවර්ධන නිලධාරීන් එක්අයෙකුගෙන් ද, කාර්යාල කාර්ය සහායකවරු දෙදෙනකුගෙන් ද, රියැදුරු මහතකුගෙන් ද සමන්විත වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අංශයේ කාර්යය භාරය වන්නේ, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ දී සංවර්ධන සැලසුම් සකස් කිරීමටත්, එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් පරිපාලන කටයුතු සඳහාත් දිස්ත්‍රික්ක මට්ටමින් අවශ්‍ය තොරතුරු සැපයීමයි. මෙම තොරතුරු සංගණනයන් මඟින් නියැදි සමීක්ෂණ මඟින් හා ප්‍රාථමික වාර්තාකරුවන් හා ආයතන මඟින් එක්රැස් කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් සමීක්ෂණ 2015 වසරේදී සිදු කරන ලදී.

- වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - යල/මහ කන්න අනුව 2014/2015
- ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - මාසිකව
- කාර්තුගත කාර්මික නිෂ්පාදන සමීක්ෂණය - කාර්තු අනුව

සංඛ්‍යාලේඛන අංශය විසින් පහත සඳහන් දත්තයන් ප්‍රාථමික වාර්තා කරුවන් මඟින් එක්රැස් කරයි.

- වාර්ෂිකව
  - සත්ව පාලන සංඛ්‍යාලේඛන 2015
  - පලාත් පාලන සංඛ්‍යාලේඛන 2015
  - මෝටර් රථ වාහන ලියා පදිංචි කිරීම 2015
  - පොල් නිෂ්පාදන ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය 2015
- කන්න අනුව

- කෘෂිකාර්මික භෝග පිලිබඳ සංඛ්‍යාලේඛන (වී, අතිරේක බෝග, පළතුරු,ස්ථිර බෝග)

❖ මාසිකව

- ප්‍රාදේශීය නිෂ්පාදන මිල, පාරිභෝගික සිල්ලර මිල කුරුණෑගල නගරයදිස්ත්‍රික්කයේ තෝරාගත් මධ්‍යස්ථාන 02ක ජාත්‍යන්තර පාරිභෝගික මිල සැසඳීම සඳහා මිල එකතු කිරීම.
- ගොඩනැගිලි සංඛ්‍යාලේඛන පළාත් පාලන ආයතන මට්ටමින්

- මීට අමතරව විමධ්‍යගත කිරීමේ වැඩපිලිවෙල යටතේ ශ්‍රමබල සමීක්ෂණ කටයුතු පරිගණක ගත කිරීමද මෙම අංශයෙන් ඉටුකරන ලදී.

- පළාත් පාලන කටයුතු වලදී ජනගහන දත්ත ඉදිරිපත් කිරීමෙන් දිසාපතිතුමාට සහාය ලබා දීම.

- කෘෂි කර්ම සංගණනයේ දත්ත පරිලෝකන කටයුතු සිදු කිරීම.

- ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයේ ලැයිස්තුගත කිරීමේ කටයුතු සිදු කිරීම.

**2015 වර්ෂය තුළ ඉටු කරන ලද සමීක්ෂණ / සංගණන පිළිබඳ වාර්තා**

| අනු අංකය | කාර්යය | සම්පූර්ණ කළ යුතු දිනය | අදාළ දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| **01** | කෘෂිකර්ම සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම - වී වගාව<br>1. **2014/2015** මහ කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය<br>2. **2014/2015** මහ කන්නයේ වගා හානි වූ බිම් ප්‍රමාණය<br>3. **2015** යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය<br>4. **2015** යල කන්නයේ වගා හානි වූ බිම් ප්‍රමාණය | ජනවාරි **15**<br>අප්‍රේල් **15**<br>ජුලි **15**<br>ඔක්තෝබර් **15** | **100%**<br>**100%**<br>**100%**<br>**100%** |
| **02** | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ වැඩසටහන<br>1. **2014/2015** මහ කන්නය<br>2. **2015** යල කන්නය | මාර්තු **30** දක්වා<br>අගෝස්තු **30** දක්වා | **100%**<br>**96%** |
| **03** | ගොඩ ගොවිතැන් වාර්තාව<br>1. **2014/2015** මහ කන්නය<br>2. **2015** යල කන්නය | ජූනි **01**<br>ඔක්තෝබර් **15** | **100%**<br>**100%** |
| **04** | සත්ත්ව පාලන සංඛ්‍යා ලේඛන **2015** | අගෝස්තු **30** | **100%** |
| **05** | කෘෂිකර්ම සංගණනයට අදාළ ව ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු | අගෝස්තු **30** | **100%** |
| **06** | මස් පිණිස සතුන් මැරීමේ වාර්තාව | මාර්තු **15** | **100%** |
| **07** | ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය | සෑම මසකම තෙවන සතිය | **100%** |
| **08** | දේශීය නිෂ්පාදන මිල හා නාගරික සිල්ලර මිල<br>1. සතිපතා මිල<br>2. අර්ධ මාසික ව කාණ්ඩ **i**<br>3. මාසික ව කාණ්ඩ **ii**<br>4. කාර්තු අනුව කාණ්ඩ **iii** | සතියකට වරක්<br>**1** වන හා **3** වන සතිය<br>මසකට වරක්<br>මාස **3**කට වරක් | **100%**<br>**100%**<br>**100%**<br>**100%** |
| **09** | ත්‍රෛමාසික කර්මාන්ත සමීක්ෂණය - **2015** | මාස **3**කට වරක් **4** වන මස **20** දිනට පෙර | **100%** |
| **10** | පළාත් පාලන සංඛ්‍යාලේඛන - **2015** | මාර්තු **30** | **100%** |

| | | | |
|---|---|---|---|
| 11 | කර්මාන්ත සංගණනය 2015 ක්ෂේත්‍ර කටයුතු | දෙසැම්බර් 20 | 100% |

**2.11 ජාතික පොහොර ලේකම් කාර්යාලය.**

**1. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්.**

ප්‍රධාන කාර්යාලයේ අය වැය ඇස්තමේන්තුව අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයට රුපියල් 135,000.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

ඒ අනුව රජයේ සහනාධාර පොහොර වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම හා එහි අරමුණ හා ඉලක්කයන් සපුරාගැනීම සඳහාත්, 1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ, විධිවිධානයන් දිස්ත්‍රික්කය තුල නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම සඳහාත් ඒ පිළිබඳ දැනුවත් භාවය හා අවබෝධය අදාළ නිලධාරීන් වෙත ලබා දීම අවශ්‍යතාවයකි. ඒ අනුව එම ප්‍රතිපාදන මඟින් දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි පුහුණු හා දැනුවත් කිරීමේ වැඩමුළු අදාළ පාර්ශවකරුවන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද අතර එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | කවුරුන් සඳහාද ? | සහභාගී වූ සංඛාව | දරණ ලද වියදම රු. ශත. |
|---|---|---|---|---|
| පොහොර පනත, රජයේ පොහොර සහනාධාර ප්‍රතිපත්තිය හා විධිමත් පොහොර භාවිතය | 08 | ගොවි සංවිධාන සාමාජිකයන් හා කෘ.ප.නි.ස. සහකාරවරුන් | 425 | 43,540.00 |
| වෙනත් | 27 | කන්න රැස්වීම් හා වෙනත් ආයතනවලින් සංවිධානය කරන ලද වැඩසටහන්වල දී. | | |
| එකතුව | | | | 43,540.00 |

**2. තොග සත්‍යාපනය හා පොහොර ගබඩා පරීක්ෂාව.**

රජයේ සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී දිස්ත්‍රික්කයේ රජයේ සමාගම් සතු ප්‍රාදේශීය පොහොර ගබඩා හා ගොවි ජනසේවා මධ්‍යස්ථාන සතු පොහොර ගබඩා පරීක්ෂා කරමින් පවතින තොග තත්ත්වයන් වාර්තා කිරීම සිදුකෙරේ. එමෙන්ම දිස්ත්‍රික්කය තුල පොහොර අලෙවිකරුවන් සඳහා බලපත්‍ර ලබාදීමේ දී පොහොර අලෙවි කරුවන්ගේ ගබඩාවල යෝග්‍යතාව පරීක්ෂා කිරීමද, ඒ අනුව තොග සත්‍යාපනය හා ගබඩා පරීක්ෂාව සඳහා ලබාදී තිබූ රු. 30,000.00 ක ප්‍රතිපාදන පහත පරිදි යොදා ගන්නා ලදී.

| කාර්යය | නිමකරන ලද වැඩසටහන් සංඛ්‍යාව | දරණ ලද වියදම රු. ශත. |
|---|---|---|
| තොග සත්‍යාපනය හා ගබඩා පරීක්ෂණ | 122 | 17,000.00 |

**3. පොහොර නියැදි ලබාගැනීම හා තත්ත්ව විශ්ලේශණය.**

ගොවීන් වෙත ගුණාත්මය තහවුරු කරන ලද රසායනික පොහොර ලබාදීම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සෘජු වගකීම හා කාර්යභාරයවේ. ඒ අනුව පොහොර විධිමත් කිරීමේ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව දිස්ත්‍රික්කයේ පොහොර අලෙවිසැල් වෙත ගොස් අහඹු ලෙස ලබාගන්නා විවිධ රසායනික පොහොර

නියැදි අදාළ රසායනාගාර වෙත යොමු කර තත්ත්ව විශ්ලේශණය කර එහි යෝග්‍යතාවය තහවුරු කර ගනු ලබයි. මේ සඳහා 2015 වර්ෂයට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වෙත රු. 60,000.00 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එම මුදල් පහත පරිදි යොදා ගන්නා ලදී.

| විස්තරය | විශ්ලේෂණය කළ පොහොර නියැදි සංඛ්‍යාව | දරණ ලද වියදම රු. |
|---|---|---|
| ජා.පො.ලේ ප්‍රතිපාදන මඟින් | **22** | **52,000.00** |
| පොහොර ආනයන ආයතන මඟින් | **240** | සමාගම් විසින් දරණ ලදි. |

දිස්ත්රික්කයේ පොහොර ආනයනකරුවන් පොහොර මෙරටට ගෙන්වීමට පෙර හා ගෙන්වීමෙන් පසුත් වෙළඳපළට නිකුත් කිරීමට පෙරත් ආනයනකරුවන් විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ, එම පොහොරවල ගුණාත්මක භාවය ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් පරීක්ෂණාගාරයක් වෙත යොමු කර තහවුරු කරවා ගතයුතුය. ඒ අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආනයනකරුවන් විසින් ගෙන්වන ලද රසායනික පොහොර නිරන්තරයෙන් තත්ත්ව විශ්ලේෂණයන්ට භාජනය කර එහි යෝග්‍යතාව තහවුරු කර ගනිමින් ගොවියා වෙත ගුණාත්මක පොහොර ලබා දීමට කටයුතු කරන ලදී.

**4.** වංචා හා අක්‍රමිකතා වැළැක්වීම.

ගොවීන් වෙත ලබා දෙන සහනාධාර පොහොර සඳහා ගොවියා දරණ මුදලට වඩා වැඩි මුදලක් රජය දරණ බැවින්, මෙම පොහොර භෝගයට යොදන තුරු එය රජයේ දේපළක් සේ සලකා කටයුතු කරනු ලබයි. ඒ අනුව සහනාධාර පොහොර බෙදා හරින ආයතන විසින් මෙම පොහොර බෙදා හැරීමට අදාළ ව පවත්වා ගෙන යනු ලබන ලේඛන, තොග තත්ත්වයන් හා පොහොර ගබඩා, ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් නිරන්තර ව පරීක්ෂා කරමින් වංචා හා අක්‍රමිකතා වැළැක්වීමට කටයුතු කරන ලදී.

**5.** ගොවි පැමිණිලි පරීක්ෂාව.

පොහොර බෙදා හරින මධ්‍යස්ථාන වෙතින් ලබාගන්නා පොහොර ගොවි සංවිධාන විසින් රැගෙන ගොස් ගොවියා වෙත ලබා දීමට කටයුතු කරයි. මෙහි දී ඇතැම් අවස්ථාවල ඇතිවූ ගැටළු හා අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත 2015 වර්ෂයේ දී ලැබුණු පැමිණිලි ගණනාවක් සම්බන්ධයෙන් විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද

**6.** සහනාධාර පොහොර බෙදාහැරීමේ වැඩසටහන.

රජයේ පොහොර සහනාධාර වැඩසටහන 2015 යල කන්නයේ හා 2015/16 මහ කන්නය තුල දී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව යූරියා, ත්‍රිත්ව සුපිරි පොස්පේට් හා මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර කිලෝ 50 ක් රු. 350.00 බැගින් ගොවීන් වෙත සපයන ලදී.

තවද 2013/14 මහ කන්නයේ සිට ක්‍රියාත්මක වූ වගා රක්ෂණ ක්‍රමයට අනුව ගොවීන් වෙත ලබා දෙන සහනාධාර පොහොර කිලෝ ග්‍රෑම් එකකට රු. 3.00 බැගින් වූ රක්ෂණ මුදලක් අය කර ගත් අතර එම මුදල් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කරන ලදී. මෙමඟින් වගා කන්නයක් සඳහා අක්කරයකට රු. 10,000.00 ක උපරිමයකට යටත්ව, වන අලීන්ගෙන්, නියඟයෙන් හා ගංවතුරෙන් සිදු වන හානි සඳහා රක්ෂණ ආවරණයක් ගොවියා වෙත ලබා දෙන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවි ජන සංවර්ධන මධ්‍යස්ථාන 56 ක් හා පූර්ව අනුමැතිය ලබාගත් සමූපකාර සමිති හා ගොවි සමාගම් එක්ව සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික්කයේ සියලු ම ගොවීන් වෙත මෙම පොහොර සහනාධාරය නියමිත වෙලාවට ලබා දීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය කටයුතු කරන ලදී.

**2015 යල කන්නයේ පොහොර බෙදාහැරීමේ ප්‍රගතිය.**

| කන්නය | නිකුත් කල පොහොර ප්‍රමාණය මෙ.ටො. | | වාණිජ වටිනාකම රු. මිලියන | රජය දරණ ලද වියදම රු. මිලියන | පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් |
|---|---|---|---|---|---|---|
| **2015 යල කන්නය** | යූරියා | **11779.3** | **740.81** | **658.34** | **131623** | **64587** |
| | ටී.එස්.පී. | **2850.84** | **174.00** | **154.10** | | |
| | එම්.ඕ.පී. | **2966.17** | **166.20** | **145.43** | | |
| එකතුව | | **17596.31** | **1081.01** | **957.87** | | |

පසුගිය **2015** යල කන්නයේ හෙක්ටයාර් **70255** ක් වගා කිරීමට ඉලක්ක කර තිබුනු අතර පැවති කාලගුණික තත්ත්වය හා අනෙකුත් සාධක අනුව ඉන් හෙක්ටයාර් **64587** ක් වගා කිරීමට හැකිවිය. ඒ අනුව **91%** ක වගා ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය.

**2015/16** මහ කන්නයේ වගා ඉලක්කය හෙක්ටයාර් **80342** ක් වූ අතර සහනාධාර පොහොර මෙ.ටො. **22800** ක් පමණ බෙදාහැරීමට ඉලක්ක කර තිබුනි. පැවති කාලගුණික තත්ත්වය අනුව ඉන් **80%** ක පමණ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවිය.

හුණු පිටිය රජයේ ප්‍රධාන පොහොර ගබඩාවල සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ගබඩා වෙත පොහොර ප්‍රවාහනය කොට ගොවි ජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත නිකුත් කෙරෙන අතර ඇතැම් අවස්ථාවන්හිදී එම ගබඩාවල තොග තත්ත්වයන් ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් නො වීමත් නිසා සුළු ප්‍රමාදයෙන් ඇති වුවද ජාතික පොහොර ලේකම් කාර්යාලය සෘජුවම මැදිහත් වී එම අභියෝගයන් ජය ගන්නා ලදී.

ඒ අනුව පැවති සීමිත සම්පත් හා අනෙකුත් සාධක කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරමින් ජාතික පොහොර ලේකම් කාර්යාලය එහි වගකීම හා කාර්යය භාරය කුරුණෑගල දිස්ත්‍රික්කය තුල උපරිමයෙන් ඉටු කරන ලද බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙනි.

**2.12** රාජ්‍ය නොවන සංවිධාන අංශය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජ්‍ය නොවන සංවිධාන අංශය මගින් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම, ව්‍යාපෘති පරික්ෂා කිරීම්, සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම ආදිය මූලිකව සිදු කරනු ලබයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සංවිධාන සංඛ්‍යාව **60** කී. **2015** වසරේ ව්‍යාපෘති පරික්ෂා කිරීම් **59** ක් හා සම්බන්ධීකරණ රැස්වීම් **2** ක් පවත්වා ඇත.

**2.13** සංස්කෘතික අංශය.

කලායතන ප්‍රායෝගික විභාගය පැවැත්වීම, සංස්කෘතික සායන වැඩසටහන යටතේ දෙසැම්බර් මස **13** වන දින ඇස් කණ්නාඩි ලබා දීම, සංස්කෘතික බල මණ්ඩල ජාතික වැඩසටහන, දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය පැවැතිවීම, දිස්ත්‍රික්කයේ සියළුම කලාකරුවන් රැස්කර නව දිසාපතිතුමා සමග සාකච්ජාවක් පවත්වා ඔවුන්ගේ අදහස් හා ගැටළු සාකච්ජා කිරීම, ජාතික නිදහස් දිනය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිත් පිංකම් සංවිධානය හා දානමය කටයුතු සිදු කිරීම සඳහා සහය දැක්වීම, දිස්ත්‍රික්කය පුරා පවතින විහාර දේවාල දේවස්ථාන වල පෙරහැර කටයුතු සහ කලායතන වල පරික්ෂණ කටයුතු සිදු කිරීම, සාහිත්‍ය කලා

ප්‍රසාදිනී උත්සවය සංවිධාන කටයුතු සඳහා සහය දැක්වීම, සංස්කෘතික නිලධාරීන් සඳහා වන ප්‍රගති සමාලෝචන වැඩසටහන, පෙර පාසල් දරුවන් සඳහා දේශන පැවැත්වීම, රම්බඩගල්ල ශෛලමය බුදුරුව නිරාවරණය කිරීමේ උත්සව කටයුතු සිදු කිරීම සඳහා සහය දැක්වීම, හින්දු දහම් පාසල් ළමුන්ගේ ප්‍රායෝගික තරග පැවැත්වීම ප්‍රධාන කොට සැලකිය හැකිය.

**2.14** බෞද්ධ කටයුතු අංශය.

2015 වර්ෂයේදී මෙම අංශයෙන් සිදු කල ප්‍රධාන කාර්යන් වනුයේ,

1. සර්ව රාත්‍රික පිරිත් දේශනය හා දානමය පිංකම පැවැත්වීම.
2. පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන 2014 විභාගය පැවැත්වීම.
3. සමස්ත ලංකා සිසු නිපුණතා තරඟ 2015 සඳහා සිසුන් පුහුණු කිරීම.
4. වාරියපොල ශ්‍රී සුමංගල නාහිමි සැමරුම් ජාතික උත්සවය පැවැත්වීම.
5. දහම් පාසල් දිස්ත්‍රික් භක්ති ගීත වැඩ සටහන පැවැත්වීම.
6. දහම් පාසල් ගුරු විභාගය පැවැත්වීම.
7. පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන 2015 සමාරම්භක උත්සවය පැවැත්වීම.
8. රිදීගම රම්බඩගල්ල, මොනරාගල විහාරස්ථානයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීම.
9. දහම් පාසල් ගුරු සිසු ලේඛන හා සම්පිණ්ඩන වාර්ථා සකස් කිරීම හා භාරදීම.
10. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ 151 වන ජන්ම දින සැමරුම් වැඩසටහනක් පැවැත්වීම.

**2.15** සමාජ සේවා අංශය.

සමාජ සේවා අංශය මගින් ආබාධිතයින් ප්‍රජාවේ තබා පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන මූලිකව සිදු කරනු ලබයි.මේ යටතේ,

| ඉටු කරන ලද කාර්යය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබාදුන් මුදල රු. |
|---|---|---|
